# මූලික අයිතිවාසිකම්

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

# මූලික අයිතිවාසිකම්

ISBN 978-955-8929-17-9

| | | |
|---|---|---|
| ප්‍රථම මුද්‍රණය | : | 2015 |
| උපදේශකත්වය | : | නීතිඥ නිමල් පී පුංචිහේවා<br>නීතීඥ සමන්ති ජයමාන්න පරණගම |
| සංස්කරණය | : | නීතිඥ මේනකා හේරත්<br>නීතීඥ කේ. කපිලන් විල්ලවරාජන් |
| සහාය | : | තුෂාරා ජීවන්ති |
| කවර චිත්‍ර නිර්මාණය | : | චාරුණ්‍යා කුලතිලක |
| පිටුසැකසුම සහ මුද්‍රණය | : | විකුම් ග්‍රැෆික්ස්, නො 33, මායා මාවත,<br>පතිරගොඩ, මහරගම. |
| ප්‍රකාශනය | : | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව<br>අංක 165, කින්සි පාර, කොළඹ 08. |

ISBN 978-955-8929-17-9

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මහජන ව්‍යාපෘතියකි

# මූලික අයිතිවාසිකම් යනු

යම් මානව අයිතිවාසිකමක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කළ විට එය මූලික අයිතිවාසිකමක් ලෙස සැලකේ. නවීන ලෝකයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයන් ඇතුළත් කර ඇත. මෙකී ඇතුලත් කිරීම අන්තර් ජාතිකව පිළිගත් තත්ත්වයකි. මූලික අයිතිවාසිකම් මානව අයිතිවාසිකම් හා සමාන වුවත්, ඒ දෙක අතර වෙනස්කම් ද පවතී. ඒ නෛතික දණ්ඩනය මත සහ අධිකරණයක දී නීතිය බලාත්මක කරවා ගැනීම සම්බන්ධයෙනි. මානව අයිතිවාසිකම් වලට එවැනි නෛතික හැකියාවක් නොමැති මෙන්ම අධිකරණය ඉදිරියේ නීති බලාත්මක කර ගැනීමට ද ඇති ඉඩකඩ සීමිතය.

එමෙන්ම ජාත්‍යන්තරව ආයාචනය කිරීමේ දී ද මේ අතර වෙනසක් පවතී. එනම් මූලික අයිතිවාසිකම් රටකට විශේෂිත වන අතර රටේ ඉතිහාසය හා රටේ සංස්කෘතිය මත එය සකස් වේ. මානව අයිතිවාසිකම් බොහෝ විට ඒහා සමාන තත්වයක පවතින නමුත් එය විශ්වීය වේ.

පෞද්ගලික සබඳතාවල දී රජයන් සමග වන මූලික අයිතිවාසිකම් තුල වැදගත් කමක් හඳුනා ගැනීමට හැකියාවක් ඇත. ඒ තුලින් සෑම පුරවැසියකුට ම ජීවිතය පිළිබඳව නිදහස, සතුට ආදී අයිතීන් සහතික කර ඇත. ඒවා ඍජුවම රජයට එරෙහිව ක්‍රියාත්මක වේ. මෙම මූලික අයිතිවසිකම් තුළින් රජයේ අත්තනෝමතික බලය හා කාර්යයන් සීමා කර තිබේ.

ඉන්දියාවේ භගවතී විනිශ්චයකාරවරයා මූලික අයිතිවාසිකම් යන්න පහත පරිදි පෙන්නුම් කර දෙයි.

"මූලික අයිතිවාසිකම් වලට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ විශේෂිත ස්ථානයක් ලබා දී තිබීම විශ්වීයව හඳුනා ගැනීමට හැකි කරුණකි". එසේම **"මූලික අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෘද සාක්ෂිය ලෙසත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආත්මය ලෙසත් පිළිගනු ලැබේ"**[1]

[1]මනේකා ගාන්ධි එ. ඉන්දීය ජනරජය

# ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම්

ශ්‍රී ලංකාව, මූලික අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට කිහිප ආකාරයකින් බැඳී සිටී. එම අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කර තිබේ. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ලාංකීය ජනතාවගේ අභිමානය සහ සමෘද්ධිය සහතික කිරීම සඳහා **"නිදහස, සමානාත්මතාවය, සාධාරණත්වය, මූලික අයිතිවාසිකම් සහ අධිකරණයේ ස්වාධීනත්වය සහතික කර ඇත".**

1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් සෘජුවම ඇතුළත් කර නොතිබුණත් එහි 29(2) වගන්තියෙන් ජනවාර්ගික හෝ ආගමික නිදහස උල්ලංඝනය වන ආකාරයේ නීති සම්පාදනය පාර්ලිමේන්තුව වෙත සීමා කරන විධිවිධාන දක්වා ඇත. මෙමගින් සුළුතර අයිතිවාසිකම් සුරැකීම සහතික කර ඇත.

පළමු වතාවට මූලික අයිතිවාසිකම් නමින් ඇතුළත් කරන ලද්දේ 1972 ශ්‍රී ලංකා ප්‍රථම ජන රජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේය. නමුත් එහි මූලික අයිතිවාසිකම් කඩ වූ විට නෛතිව බලාත්මක කර ගැනීමේ ක්‍රමවේදයක් නොවීය. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රටේ හදිසි තත්ත්වයන් යටතේ වුවද මෙකී අයිතිවාසිකම් යටපත් කිරීමට ඉඩක් නොවීය.

1978 දෙවන ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් ඇතුළත් කර ඇති අතර ඒ තුළ මූලික අයිතිවාසිකම් හා ඒවා නෛතිකව බලාත්මක කර ගැනීමට හැකි ක්‍රමවේදයක් ලෙස ශ්‍රී ලංකවේ ඉහලතම අධිකරණය වන ශ්‍රේෂ්ඨාධිකරණය වෙතට බලය පවරන ලදී.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **"3 වන වගන්තිය"** අනුව ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍යය ජනතාව කෙරෙහි පිහිටා ඇත්තේය "පරමාධිපත්‍ය අත්හල නොහැකිය" පරමාධිපත්‍යයට පාලන බලතල (විධායක, ව්‍යවස්ථාදායක හා අධිකරණමය) **මූලික අයිතිවාසිකම්** හා ඡන්ද බලය ද ඇතුළත් වන්නේය. "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් රටක් පාලනය කළ යුතු පොදු නෛතික රාමුවක් ද සපයයි" එය පිළිගත් පොදු නීතිත්, ආණ්ඩුවේ ක්‍රියාමාර්ග හා තීරණ මත පදනම් ව සහ අගය කිරීම් ආදිය තුළින් සකස් වී ඇත.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 (ඈ) ව්‍යවස්ථාව අනුව "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම් සියලුම පාලන ආයතන විසින් ගරු කරනු ලැබිය යුතුය. ආරක්ෂා කරනු ලැබිය යුතුය. වර්ධනය කරනු ලැබිය යුතුය. තවද ඒවා මින් මතු විධි විධාන සලස්වා ඇති ආකාරයට හා ප්‍රමාණයට මිස සංක්ෂිප්ත කිරීම හෝ සීමා කිරීම හෝ අහිමි කිරීම නොකළ යුතුය". මීට අමතරව 6 වන පරිච්ඡේදයේ රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්ම සහ මූලික යුතුකම් හි 27(2) (අ) සඳහන් වන පරිදි

"රජය සියලු තැනැත්තන්ගේ ම මූලික අයිතිවාසිකම් නන් වැදෑරුම් නිදහස සපුරාලීමට ඇප කැප වී සිටී.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 10 සිට 14 වගන්ති තෙක් මූලික අයිතිවාසිකම් ඇතුලත් කර තිබීම තුලින් ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ආරක්‍ෂා කර තිබේ. වගු අංක 01 හි III වන පරිච්ඡේදයේ ඇතුල් කර ඇති මූලික අයිතිවාසිකම් දක්වා ඇත. මේ පරිච්ඡේදයෙහි සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්බන්ධයෙන් වැඩිදුර අවධානයක් යොමු කර ඇති බව පෙනී යන අතර ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් කෙරෙහි එවැනි අවධානයක් යොමු වී නොමැත.

| ව්‍යවස්ථාව | අයිතිය / නිදහස |
|---|---|
| 10 ව්‍යවස්ථාව | ● සිතීමේ අයිතිය<br>● හෘද සාක්ෂියේ නිදහස<br>● ආගමේ අයිතිය |
| 11 ව්‍යවස්ථාව | ● වධහිංසාවෙන් තොර වීමේ අයිතිය<br>● කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලට භාජනය වීමෙන් තොර වීමේ අයිතිය<br>● කෲර අමානුෂික හෝ අවමන් සහගත දඬුවමෙන් තොර වීමේ අයිතිය |
| 12 ව්‍යවස්ථාව | ● සැමට නීතිය ඉදිරියේ සමානාත්මතාවය ලැබීමේ අයිතිය<br>● සැමට නීතියේ රැකවරණය ලැබීමේ අයිතිය<br>● ජාතිය, ආගම, භාෂාව, වර්ගය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය ආදිය මත වෙනස්කමකට ලක් නොවී සිටීමේ අයිතිය. |
| 13 ව්‍යවස්ථාව | ● නීතියෙන් නියම කරන ලද කාර්ය පටිපාටියට හැර අත් අඩංගුවට ගත නොහැක.<br>● සිරභාරයට ගැනීමේ හේතුව ද දැන්විය යුතුය<br>● නීතියේ සඳහන් පරිදි, විනිශ්චයකාරවරයෙකුගේ ආඥාවක් මත හැර අත් අඩංගුවට ගෙන රඳවා තබා ගැනීමෙන් වැලකීමේ නිදහස<br>● චෝදනා නගා ඇති පාර්ශවයට නිසි අධිකරණයක් ඉදිරියේ සාධාරණ නඩු විභාගයක දී, පෞද්ගලිකව හෝ නීතිඥයකු මාර්ගයෙන් කරුණු කියා පෑමට ඇති අයිතිය.<br>● නීතියෙන් නියම කරන ලද කාර්ය පටිපාටියට අනුව නිසි අධිකරණයක ආඥාවකින් මිස මරණ දඬුවම් පැනවීම හෝ බන්ධනාගාර ගත නොකළ යුතුය.<br>● වරදකරු යැයි ඔප්පු කරන තෙක් නිර්දෝෂී යැයි පූර්ව නිගමනය කළ යුතුය. (නිර්දෝෂී භාවයේ පූර්ව නිගමනය) |

| | |
|---|---|
| | • ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සිදු කරන ලද අවස්ථාවේ වරදක් (අපරාධමය වරදක්) නොවේ නම් එවැන්නකට වරදකරු නොවිය යුතුය. |
| 14 ව්‍යවස්ථාව | • භාෂණයේ නිදහස<br>• ප්‍රකාශනයේ නිදහස<br>• අදහස් පළ කිරීමේ නිදහස<br>• තොරතුරු වෙත ප්‍රවේශවීමේ අයිතිය<br>• සාමකාමීව රැස්වීමේ නිදහස<br>• සමාගමේ නිදහස<br>• වෘත්තීය සමිති පිහිට වීමේ සහ බැඳීමේ නිදහස<br>• තම ආගම ඇදහීමට, පිළිපැදීමට, ප්‍රගුණ කිරීමට හා ඉගැන්වීමේ නිදහස<br>• තනිව හෝ අන් අය සමග ස්වකීය සංස්කෘතිය භුක්ති විඳීමේ හා වැඩිදියුණු කිරීමේ හා ස්වකීය භාෂාව භාවිතා කිරීමේ නිදහස<br>• නීත්‍යානුකූල රැකියාවක, වෘත්තීයක, කර්මාන්තයක, වෙළඳාමක හෝ ව්‍යවසායක නිරත වීමේ නිදහස<br>• ලංකාව තුළ යාමේ, ඊමේ නිදහස<br>• කැමති ස්ථානයක ජීවත් වීමේ නිදහස<br>• ලංකාවට නැවත පැමිණීමේ නිදහස |

වගු අංක 01

වගු අංක 01 හි සඳහන් කර ඇති මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 10 සහ 11 වගන්ති වල සඳහන් අයිතිවාසිකම් පරිපූර්ණ අයිතිවාසිකම් වේ. කිසිදු වෙනස්කමකින් තොරව එකී අයිතිය ලබා ගැනීමේ පරම හිමිකම පවතී. එමෙන්ම 12, 13 සහ 14 වගන්තීන් හි අයිතිවාසිකම් සඳහා යම් යම් සීමාවල් විවිධ හේතු මත පනවා ඇත. එසේම 10, 11, 12 (1), 12(3) හා 13 වන වගන්ති සෑම පුද්ගලයෙකුටම බලපැවැත්වෙන අයිතිවාසිකම් වේ. 12 (2) හා 14 වගන්තීන් පුරවැසියන්ට පමණක් අයිති වන අයිතිවාසිකම් වේ.

## සීමාවන්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 වන වගන්තිය අනුව 12 සිට 14 දක්වා (වගු අංක 01 සඳහන් කර ඇත) වගන්තීන් හි ඇතුලත් මූලික අයිතිවාසිකම් වලට ජාතික ආරක්ෂාව, ආර්ථිකය, වාර්ගික ආගමික සහයෝගිතාවය හා මහජන සෞඛ්‍ය හෝ සදාචාරය වැනි කරුණු නිසා සීමාවන් පැනවේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වන වගන්තියට අනුව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බලපැවැත්වීමට පෙර පැවති සියලු ලිඛිත හා ලිඛිත නොවූ නීතී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ සඳහන් මූලික අයිතිවාසිකම් විධිවිධාන වලට අනුකූල නොවුව ද එම පෙර පැවති නීති බලාත්මක වන බව සඳහන් වේ.

## සහන

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වන වගන්තියට අනුව මූලික අයිතිවාසිකම් පරිපාලන හෝ විධායක ක්‍රියාවක් මගින් උල්ලංඝනය කරන ලද නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන වගන්තියට අනුව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පැවරිය හැක. අදාල නඩු පැවරීම් මූලික අයිතිවාසිකම් කඩකර ඇති බව හෝ කඩකිරීමට අත්‍යාසන්න බව දැනගත් දිනසිට මාසයක් ඇතුලත සිදුකල යුතුය. මීට අමතර දේශීය නීතිය තුල පනත් මගින් ස්ථාපිත කර ඇති ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සහ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වෙත මූලික අයිතිවාසිකම් කඩවීමක දී පැමිණිලි ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත. කෙසේ වෙතත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පවතින ප්‍රතිපාදන අනුව පෞද්ගලික අංශයෙන් සිදු වන මූලික අයිතිවාසිකම් කඩවීම් පිළිබඳ සහන ලබා ගැනීමේ හැකියාවක් මහජනතාවට නොමැත.

## විධායක හා පරිපාලන ක්‍රියා

මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක දී යමෙකු වගකීමට ලක්වන්නේ එය විධායක හෝ පරිපාලන ක්‍රියාවක් නම් පමණකි. විධායක හෝ පරිපාලන යන අර්ථය තුලට පෞද්ගලික අංශය, අධිකරණය හා පාර්ලිමේන්තුව ඇතුලත් නොවේ. බොහෝ විට රජයේ නිලධාරියකු හෝ රජයේ ආයතනයක් විසින් නිල බලය අයුතු ලෙස යොදා ගැනීමක් හෝ බලය ඉක්මවා සිදු කරන ක්‍රියාවන් මත ඇතිවන මූලික අයිතිවාසිකම් උල්ලංඝනයන් මෙහි දී සලකා බලනු ලබයි.

විධායක ක්‍රියා මගින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමකදී වගකිවයුතු පාර්ශවයන්

- සියලුම අමාත්‍යාංශ ලේකම්වරු හා නිලධාරීන්
- පළාත් සභා, මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා ලේකම්වරු
- පොලිස් දෙපාර්තමේන්තුව
- ත්‍රිවිධ හමුදා

පරිපාලන ක්‍රියා මගින් වන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වගකිවයුතු පාර්ශවයන්

- සියලුම දෙපාර්තමේන්තු
- අධිකාරී
- සංස්ථා
- ව්‍යවස්ථාපිත මණ්ඩල
- ව්‍යවස්ථාපිත කොමිෂන් සභා
- 50% ට වඩා රජයේ කොටස් ඇති සමාගම්

## මූලික අයිතිවාසිකම් හි වර්ධනයන්

ලෝකයේ අලුතින් බිහි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් හි ඇතුලත් වන මූලික අයිතිවාසිකම් නවීකරණය වෙමින් නව අයිතිවාසිකම් සමූහයක් මූලික අයිතිවාසිකම් ලෙස ඇතුලත් වීම අද වන විට දක්නට ලැබේ. තවද ශ්‍රේෂ්ඨාධිකරණයන් විවිධ කෝණයන්ගෙන් සලකා බලමින් පුළුල් නව අර්ථ නිරූපණයන් මූලික අයිතිවාසිකම් වලට සැපයීම මගින් ද මෙම අයිතීන් වල වර්ධනය වීමක් සිදුවෙමින් පවතී. ලෝකය තුල මුලින් ම මනුෂ්‍යයාගේ නිදහසට හා දේශපාලන ජීවිතයට ඇති අයිතිය සම්බන්ධව සාකච්ඡා කරමින් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් වර්ධනය වෙමින් ඒවා මූලික අයිතිවාසිකම් තුල අන්තර්ගත වන්නට විය. පසුව ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් දෙස ලෝක අවධානය යොමු වී ඒ සම්බන්ධව සාකච්ඡා කිරීම ආරම්භ කරන ලදී. එතැනින් නොනැවතුන ලෝක විද්වතුන් තනි පුද්ගලයාගේ අයිතිවාසිකම් නොව සාමූහික අයිතිවාසිකම් පිළිබඳව අවධානය යොමු කරමින් කණ්ඩායම් අයිතිවාසිකම් පිළිබඳව මූලික අයිතිවාසිකම් තුලින් සාකච්ඡා කොට සාමූහික අයිතිවාසිකම් වර්ධනයට කටයුතු කරනු ලැබීය. මේ සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අමිල දායකත්වයක් සපයනු ලැබීය.

උදා:- ඉන්දියාවේ මහජන හිතකර නඩුකර.

තවදුරටත් ඉදිරියට යමින් මේ වන විට මානව වර්ගයාගේ සුභ සාධනය පිළිබඳව සලකා බැලීමක් සිදු කරන අතර මූලික අයිතිවාසිකම් තුලින් ඒ පිළිබඳව නව මානයන්ගෙන් සලකා බලමින් වර්ධනයන් සිදු කරයි.

මෙම නව ප්‍රවණතාවයන් මහජනයාට සිදු වන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම් වලින් ඔවුන්ව සුරක්ෂිත කිරීමට මනා පිටුවහලක් සපයමින් මූලික අයිතිවාසිකම් දෙස නව දැක්මකින් බැලීමට ලෝක අවධානය යොමු කරමින් පවතියි.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

### iii වන පරිච්ඡේදය

# මූලික අයිතිවාසිකම්

### සිතීමේ නිදහස හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස

10. සෑම තැනැත්තෙකුටම තමන් අභිමත ආගමක් ඇදහීමේ හෝ වැළඳ ගැනීමේ නිදහසද ලබ්ධියක් හෝ විශ්වාසයක් දැරීමේ හෝ පිළිගැනීමේ නිදහසද ඇතුළුව සිතීමේ නිදහසට හෘද සාක්ෂියේ නිදහසට සහ ආගමික නිදහසට හිමිකම් ඇත්තේය.

### වධ හිංසා වලින් නිදහස

11. කිසිම තැනැත්තෙකු වධ හිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය.

### සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම

12. (1) නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද නීතියේ රැකවරණයද සර්ව සාධාරණ විය යුත්තේය.

(2) කිසිම පුරවැසියෙකු වර්ගය, ආගම, භාෂාවද කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජනය නොවිය යුත්තේය. :

එසේ වුවද රජයේ සේවයේ, අධිකරණ සේවයේ පළාත් පාලන සේවයේ නැතහොත් යම් රාජ්‍ය සංස්ථාවක සේවයේ යම් සේවා නියුක්තියක හෝ ධුරයක කාර්ය ඉටුකිරීම සඳහා යම් තැනැත්තකු යම් භාෂාවක් පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් ඇතිව සිටීම සාධාරණව අවශ්‍ය වන අවස්ථාවක ඒ සේවා නියුක්තිය හෝ ධුරය සඳහා සුදුසුකමක් වශයෙන් ඒ භාෂාව පිළිබඳව එසේ ප්‍රමාණවත් දැනීමක් සාධාරණ කාලයක් තුළදී ලබා ගත යුතු යයි එවැනි තැනැත්තකුට නියම කිරීම නීත්‍යානුකූල වන්නේය.

එසේම තවදුරටත් එවැනි යම් සේවා නියුක්තියක හෝ ධූරයක හෝ කිසිදු කර්තව්‍යයක් යම් භාෂාවක් පිළබඳ දැනීම ඇත්තේ නම් මිස ඉටු කළ නොහැකි වන අවස්ථාවලදී, ඒ සේවා නියුක්තියට හෝ ධූරයට හෝ ඇතුලත් කර ගැනීමේ සුදුසුකමක් වශයෙන් යම් තැනැත්තෙකුට ඒ භාෂාව පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් තිබිය යුතු යැයි නියම කිරීම නීත්‍යානුකූල වන්නේය.

(3) වර්ගය, ආගම, භාෂාව, කුලය හෝ ස්ත්‍රී පුරුෂ භේදය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙළඳ සැල්වලට, පොදු භෝජනාගාර වලට, ආපනශාලාවලට, පොදු විනෝද ස්ථානවලට හෝ තම තමාගේ ආගමට අයත් පොදු පූජනීය ස්ථානවලට ඇතුළුවීම සම්බන්ධයෙන් යම් අශක්නුතාවකට, බැඳීමකට සීමාකිරීමකට නැතහොත් කොන්දේසියකට කිසිම තැනැත්තෙක් යටත් නොවන්නේය.

(4) කාන්තාවන්ගේ, ළමයින්ගේ හෝ අබල තැනැත්තන්ගේ ප්‍රගතිය සඳහා නීතියෙන් හෝ අනුනීතිවලින් හෝ විධායක ක්‍රියා මාර්ගයෙන් හෝ විශේෂ විධි විධාන සැලැස්වීම මේ ව්‍යවස්ථාවෙන් කිසිසේත් අවහිර නොවන්නේය.

## අත්තනෝමතිකව සිරභාරයට ගැනීමෙන් රඳවා තබා ගැනීමෙන් සහ දඬුවම් කිරීමෙන් නිදහස සහ අතීතයට බලපාන දණ්ඩන නීති පැනවීම තහනම් කිරීම

13\. (1) නීතියේ නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිරභාරයට ගැනීම නොකළ යුත්තේය. යම් තැන්තෙකු සිරභාරයට ගනු ලබන්නේ යම් හේතුවක් මතද, ඒ හේතුව ඒ තැනැත්තාට දැන්විය යුත්තේය.

(2) අත් අඩංගුවෙහි තබා ගනු ලැබූ හෝ රඳවා තබා ගනු ලැබූ හෝ අන්‍යාකාරයකින් පෞද්ගලික නිදහස අහිමි කරනු ලැබූ හෝ සෑම තැනැත්තෙකුම නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටිය අනුව ආසන්නතම නිසි අධිකරණයේ විනිශ්චයකාරවයා ඉදිරියට ගෙන යා යුතු අතර, නීතියේ නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව ඒ විනිශ්චයකාරවරයා විසින් කරනු ලැබූ ආඥාව මත සහ ආඥාව ප්‍රකාර මිස, ඒ තැනැත්තා තව දුරටත් අත් අඩංගුවෙහි තබා ගැනීම හෝ රඳවා තබා ගැනීම හෝ ඒ තැනැත්තාගේ පෞද්ගලික නිදහස අහිමි කිරීම හෝ නොකළ යුත්තේය.

(3) වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තෙකුට විරුද්ධව චෝදනා නගනු ලැබ ඇත්තේද ඒ තැනැත්තාට නිසි අධිකරණයක් විසින් පවත්වනු ලබන සාධාරණ නඩු විභාගයකදී පෞද්ගලිකවම හෝ නීතිඥවරයෙකු මගින් හෝ කරුණු කියා සිටීමට හිමිකම් ඇත්තේය.

(4) නීතියේ නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව නිසි අධිකරණයක් විසින් කරනු ලැබූ ආඥාවක් අනුව මිස, කිසිම තැනැත්තෙකු මරණීය දණ්ඩනයට යටත් කිරීම හෝ කිසිම තැනැත්තෙකු බන්ධනාගාරගත කිරීම හෝ නොකළ යුත්තේය. එහෙත් විමර්ශනයක් පවත්වනතෙක් හෝ නඩු විභාගයක් පවත්වනතෙක් හෝ යම් තැනැත්තෙකු සිරභාරයට ගැනීම, අත්අඩංගුවේ තබා ගැනීම, රඳවා තබා ගැනීම හෝ අන්‍යාකාරයකින් ඒ තැනැත්තාගේ පෞද්ගලික නිදහස අහිමි කිරීම දඬුවමක් නොවන්නේය.

(5) වරදකරු යයි ඔප්පු කරනු ලබන තෙක් සෑම තැනැත්තෙකුම නිර්දෝෂී යයි පූර්වානුමාන කළ යුත්තේය :

එසේ වුවද විශේෂ වූ සිද්ධි ඔප්පු කිරීමේ භාරය, චූදිත තැනැත්තකු වෙත නීතියෙන් පවරනු ලැබිය හැක්කේය.

(6) යම් ක්‍රියාවක් කළ හෝ යම් නොකර හැරීමක් සිදු වූ අවස්ථාවේ දී ඒ ක්‍රියාව හෝ නොකර හැරීම වරදක් නොවී නම් ඒ ක්‍රියාව හෝ නොකර හැරීම සම්බන්ධයෙන් කිසිම තැනැත්තකු වරදකට වරදකරුවකු නොවිය යුත්තේය. තවද යම් වරදක් සිදු කරනු ලැබූ අවස්ථාවේදී ඒ වරද සම්බන්ධයෙන් බලපැවැත්වූ දණ්ඩනයට වැඩි කිසිම දණ්ඩනයක් ඒ වරද සම්බන්ධයෙන් නියම නොකළ යුත්තේය.

යම් ක්‍රියාවක් කළ හෝ යම් නොකර හැරීමක් සිදුවූ අවස්ථාවේදී එය ජාතින්ගේ සම්මතයෙන් පිළිගත් පොදු නෛතික මූලධර්ම අනුව සාපරාධී ක්‍රියාවක් හෝ නොකර හැරීමක් වූ විට, ඒ ක්‍රියාව හෝ නොකර හැරීම සම්බන්ධයෙන් කවර වූ හෝ තැනැත්තකු නඩු විභාගයට භාජනය කොට දඬුවම් කිරීමට මේ ව්‍යවස්ථාවේ ඇතුළත් කිසිවකින් හානියක් නොවන්නේය. යම් වරදක් සඳහා නියම කරනු ලබන අවම දණ්ඩනය ඒ වරද සිදු කළ අවස්ථාවේදී ඒ වරද සඳහා නියමිතව තිබුණු උපරිම දණ්ඩනය නොඉක්මවන්නේ නම්, ඒ වරද සඳහා එකී අවම දණ්ඩනය පනවන ලෙස නියම කිරීම මේ ව්‍යවස්ථාවේ විධිවිධාන කඩකිරීමක් නොවන්නේය.

(7) ආගමික හා විගාමික පනතේ හෝ 1967 අංක 14 දරණ ඉන්දු ලංකා ගිවිසුම (ක්‍රියාත්මක කිරීමේ ) පනතේ හෝ එකී පනත් වෙනුවට ආදේශ කිරීම සඳහා පනවනු ලබන වෙනත් නීතියක හෝ විධිවිධාන යටතේ කරනු ලබන ඉවත් කිරීමේ නියමයක නැතහොත් රටින් පිට කිරීමේ නියමයක හේතුවෙන් යම් තැනැත්තකු සිරභාරයට ගැනීම, අත් අඩංගුවේ තබා ගැනීම, රඳවා තබා ගැනිම හෝ අන්‍යාකාරයකින් ඒ තැනැත්තාගේ පෞද්ගලික නිදහස අහිමි කිරීම මේ ව්‍යවස්ථාවේ විධිවිධාන කඩකිරීමක් නොවන්නේය.

## භාෂණයේ, රැස්වීමේ, සමාගමයේ රැකියාවේ සහ යාම ඊම යනාදියේ නිදහස

14. (1) සෑම පුරවැසියකුටම -

(අ) භාෂණයේ නිදහසට සහ ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහසට

(ආ) සාමකාමීව රැස්වීමේ නිදහසට

(ඇ) සමාගමයේ නිදහසට

(ඈ) වෘත්තීය සමිති පිහිටුවීමේ සහ වෘත්තීය සමිතිවලට බැඳීමේ නිදහසට

(ඉ) එකලාව හෝ අන් අය හා සමග, ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව, තම ආගම, ලබ්ධිය හෝ විශ්වාසය ඇදහීමෙන්, පිළිපැදීමෙන්, ප්‍රගුණ කිරීමෙන් සහ ඉගැන්වීමෙන් ප්‍රකාශ කිරීමේ නිදහසට

(ඊ) එකලාව හෝ අන් අය සමග හෝ ස්වකීය සංස්කෘතිය භුක්ති විඳීමේ හා වැඩි දියුණු කිරීමේ නිදහසට සහ ස්වකීය භාෂාව භාවිතා කිරීමේ නිදහසට

(උ) එකලාව හෝ අන් අය සමග යම් නීත්‍යානුකූල රැකියාවක, වෘත්තියක, කර්මාන්තයක, වෙළඳ ව්‍යාපාරයක හෝ ව්‍යවසායක නියුක්ත වීමේ නිදහසට

(ඌ) ශ්‍රී ලංකාව තුළ යාම ඊමේ නිදහසට සහ අභිමත ස්ථානයක වාසය කිරීමේ නිදහසට
සහ

(එ) ශ්‍රී ලංකාවට පෙරළා පැමිණීමේ නිදහසට හිමිකම් ඇත්තේය.

(2) වෙනත් යම් කිසි රටක පුරවැසියකුව නොසිටියදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මකවීම ආරම්භවන තෙක් ශ්‍රී ලංකාවෙහි ස්ථිරව සහ නීත්‍යානුකූලව පදිංචිව සිටියාවූ සහ එසේ දිගටම පදිංචිව සිටින්නාවූ තැනැත්තෙකුටද

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මකවීම ආරම්භ වීමේ සිට අවුරුදු දහයක කාලයක් තුළ මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගනු ලැබ ඇති අයිතිවාසිකම් වලට හිමිකම් ඇත්තේය.

14 අ (1) සෑම පුරවැසියෙකුටම

(අ) රජය, අමාත්‍යාංශයක් හෝ යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ යම් නීතියක් මගින් හෝ යටතේ පිහිටුවනු ලැබූ හෝ ඇති කරනු ලැබූ යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් සතුව පවත්නාවූ

(ආ) යම් පළාත් අමාත්‍ය මණ්ඩලයක අමාත්‍යවරයෙකුගේ යම් අමාත්‍යාංශයක් හෝ යම් දෙපාර්තමේන්තුවක් හෝ පළාත් සභා ප්‍රඥප්තියක් මගින් පිහිටුවනු ලැබූ හෝ ඇති කරනු ලැබූ යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් හෝ සතුව පවත්නා වූ

(ඇ) යම් පළාත් පාලන ආයතනයක් සතුව පවත්නා වූ

සහ

(ඈ) මේ අනු ව්‍යවස්ථාවේ (අ), (ආ) හෝ (ඇ) ඡේදවල සඳහන් ආයතන වලට අදාළව වෙනත් යම් තැනැත්තකු සතුව පවත්නා වූ,
සහ

පුරවැසියකුගේ අයිතියක් ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වූ යම් තොරතුරක් වෙත නීතියෙන් සලසා ඇති පරිදි ප්‍රවේශ වීමේ අයිතිවාසිකම ඇත්තේය.

(2) ජාතික ආරක්ෂාව, භෞමික අඛණ්ඩතාව හෝ මහජන ආරක්ෂාව තහවුරු කිරීම පිණිසද, විෂමාචාර හෝ අපරාධ වැළැක්වීම පිණිස ද, සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීම පිණිසද, අන් අයගේ කීර්තිය හෝ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිණිසද, පෞද්ගලිකත්වය ආරක්ෂා කිරිම පිණිසද, අධිකරණයට අපහාස කිරීම වැළැක්වීම පිණිසද, පාර්ලිමේන්තු වරප්‍රසාද ආරක්ෂා කිරීම සම්බන්ධයෙන්ද විශ්වාසය මත දැනුම් දෙන ලද තොරතුරු හෙළිදරව් කිරීම වැළැක්වීම පිණිසද හෝ අධිකරණයේ අධිකාරී බලය හා අපක්ෂපාතීත්වය පවත්වාගෙන යාම පිණිසද, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයට අවශ්‍යය වන්නා වූ නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් හැර වෙනත් කවර හෝ සීමාකිරීමක් මේ ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති අයිතිවාසකම මත නොපැනවිය යුත්තේය.

3) මේ ව්‍යවස්ථාවේ පුරවැසියා යන්නට, යම් ව්‍යවස්ථාපිත වූ හෝ ව්‍යවස්ථාපිත නොවූ මණ්ඩලයක සාමාජිකයන්ගෙන් හතරෙන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් පුරවැසියන් වන්නේ නම්, එවැනි මණ්ඩලයක් ඇතුළත් වේ.

## මූලික අයිතිවාසිකම් පිළිබඳ සීමා

15 (1) 13 වන ව්‍යවස්ථාවේ (5) වන සහ (6) වන අනුව්‍යවස්ථා වලින් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේද ක්‍රියාත්මක විය හැක්කේද රාජ්‍ය ආරක්ෂාව තහවුරු කිරීම පිණිස නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමාකිරීම් වලට පමණක් යටත්වය. මෙම අනුව්‍යවස්ථාවේ කාර්ය සඳහා නීතිය යන්නට මහජන ආරක්ෂාව පිළිබඳව තත් කාලයේ අදාළ වන නීතිය යටතේ සාදන ලද නියෝගද ඇතුළත් වන්නේය.

(2) 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (අ) ඡේදයෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේද ක්‍රියාත්මක විය හැක්කේද වාර්ගික හා ආගමික සහයෝගිතාව තහවුරු කිරීම සඳහා හෝ පාර්ලිමේන්තු වරප්‍රසාද අධිකරණයට අපහාස කිරීම, අපහාසයට හෝ වරදකට පෙළඹවීම හා සම්බන්ධව නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් වලට යටත්වය.

(3) 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ආ) ඡේදයෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම භුක්ති විඳිය හැක්කේ ද ක්‍රියාත්මක විය හැක්කේද වාර්ගික හා ආගමික සහයෝගිතාව තහවුරු කිරීම සඳහා නිතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් වලට යටත්වය.

(4) 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඇ) ඡේදයෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම භුක්ති විඳිය හැක්කේද ක්‍රියාත්මක විය හැක්කේද වාර්ගික හා ආගමික සහයෝගිතාව තහවුරු කිරීම සඳහා හෝ ජාතික ආර්ථිකය ආරක්ෂා කිරීම සඳහා නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමාකිරීම් වලට යටත්වය.

(5) 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (උ) ඡේදයෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේ ද ක්‍රියාත්මක විය හැක්කේද ජාතික ආර්ථිකය ආරක්ෂා කිරීම සඳහා හෝ -

(අ) යම් වෘත්තියක යෙදී සිටීමට හෝ යම් රැකියාවක්, කර්මාන්තයක්, වෙළඳ ව්‍යාපාරයක් හෝ ව්‍යවසායක් පවත්වාගෙන යාමට අවශ්‍ය වෘත්තිය, කාර්මික අධ්‍යාපනික, මූල්‍ය සහ වෙනත් සුදුසුකම් සම්බන්ධයෙන් සහ එම මූලික අයිතිවාසිකමට හිමිකම් ලබන තැනැත්තන්ට බලපත්‍ර දීම සහ ඒ තැනැත්තන්ට විෂයෙහි විනය පාලනය සම්බන්ධයෙන් ,

සහ

(ආ) රජය විසින් හෝ රාජ්‍ය නියෝජිත අයාතනයක් විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් හෝ යම් කර්මාන්තයක, වෙළඳ ව්‍යාපාරයක්, කාර්මික ව්‍යාපාරයක්, සේවාවක්, හෝ ව්‍යවසායක් පුරවැසි සහභාගීත්වය නොමැතිව හෝ පුරවැසි කොටසක සහභාගිත්වය ඇති හෝ අන්‍යාකාරයකින් හෝ පවත්වාගෙන යාම සම්බන්ධයෙන්

නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමාකිරීම් වලට යටත්වය.

(6) 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඌ) ජේදයෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම භුක්ති විඳිය හැක්කේද ක්‍රියාත්මක විය හැක්කේද ජාතික ආර්ථිකය ආරක්‍ෂා කිරීම සඳහා නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමාකිරීම් වලට යටත්වය.

(7) 12 වන ව්‍යවස්ථාවෙන්, 3 වන ව්‍යවස්ථාවේ (1) වන හා (2) වන අනු ව්‍යවස්ථා වලින් සහ 14 වන ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති සියලුම මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේද ක්‍රියාත්මක විය හැක්කේද රාජ්‍ය ආරක්‍ෂාවද රටේ යථා පැවැත්ම ද තහවුරු කිරීම පිණිසත්, මහජන සෞඛ්‍ය හෝ සදාචාරය ආරක්‍ෂා කිරීම පිණිසත්, අන්‍යයන්ගේ අයිතිවාසිකම් හා නන් වැදෑරුම් නිදහස නිසි පරිදි පිළිගන්නා බවට සහ ඊට නිසි පරිදි ගරු කරන බවට වගබලා ගැනීම පිණිසත්, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පොදු සුභ සාධනය සඳහා යුක්ති සහගතව අවශ්‍ය දෑ සපුරාලීම පිණිසත් නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමාකිරීම් වලට යටත්වය. මෙම අනුව්‍යවස්ථාවේ කාර්ය සඳහා නීතිය යන්නට මහජන ආරක්‍ෂාව පිළිබඳව තත්කාලයේ අදාළ වන නීතිය යටතේ සාදන ලද නියෝගද ඇතුළත් වන්නේය.

(8) 12 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවෙන්, 13 වන ව්‍යවස්ථාවෙන් සහ 14 වන ව්‍යවස්ථාවෙන් ප්‍රකාශකොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් සන්නද්ධ හමුදාවන්හි සාමාජිකයන්ට, පොලිස් හමුදාවේ සාමාජිකයන්ට සහ

රටේ යථා පැවැත්ම භාරව සිටින වෙනත් හමුදාවල සාමාජිකයන්ට අදාල වීමේදී එම අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේද ක්‍රියාත්මක විය හැක්කේද ඔවුන්ගේ කාර්යයන් යථා පරිදි ඉටු කරවා ගැනීම සහ ඔවුන් අතර විනය පවත්වා ගැනීම පිණිස නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් වලට යටත්ව,

## පවත්නා ලිඛිත නීති සහ ලිඛිත නොවූ නීති බලපවත්වන බව

16 (1) පවත්නා ලිඛිත නීති සහ ලිඛිත නොවූ නීති අතුරෙන් යම්කිසි ලිඛිත නීතියක් හෝ ලිඛිත නොවූ නීතියක් යම් පරිච්ඡේදයේ මෙයට ඉහතින් ඇති විවිධ්ධාන වලට අනුකූල නොවූවද එකී සියලු පවත්නා ලිඛිත නීති සහ ලිඛිත නොවූ නීති බලාත්මකව ක්‍රියාත්මක වන්නේය.

(2) කවර වූ හෝ පවත්නා ලිඛිත නීතියකින් දඬුවමක් ලෙස පිළිගනු ලැබූ කවර වූ හෝ ආකාරයක දඬුවමකට කවර වූ හෝ තැනැත්තෙකු නිසි අධිකරණයක ආඥාව පිට යටත් කිරීම මේ පරිච්ඡේදයේ විධි විධාන කඩ කිරීමක් නොවන්නේය.

## විධායක ක්‍රියා මගින් මූලික අයිතිවාසිකම් උල්ලංගනය කිරීමට ප්‍රතිකර්මය

17. මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ යම් තැනැත්තකුට හිමි වන යම් මූලික අයිතිවාසිකමක් යම් විධායක හෝ පරිපාලනමය ක්‍රියාවක් මගින් උල්ලංඝනය කර තිබීම හෝ උල්ලංඝනය කිරීමට ආසන්නව තිබීම හෝ සම්බන්ධයෙන් 126 වන ව්‍යවස්ථාවේ විධි විධාන සලසා ඇති පරිදි ශ්‍රේෂ්ඨාධිකරණයට ඉල්ලීමක් කිරීමට ඒ තැනැත්තාට හිමිකම් ඇත්තේය.